(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 212.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා අ. භා. 1.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1200/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා ගිය රටවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී රැකියා සඳහා මෙම රටවලට ගිය ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් උපයාගත් සාමාන්‍ය වැටුප කොපමණද;

(iv) ඔවුන්ට ලැබෙන වැටුපෙහි අවම වැටුප් මට්ටමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1579/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර ප්‍රධාන තැපැල් කාර්යාලයේ පිහිටි නිලධාරීන්ගේ නේවාසිකාගාරය දැඩිසේ අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1911/'11

3\.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2001 මැයි මස කැබිනට් අනුමතිය ලැබුණු "ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තියේ" නියමයන්ට අනුකූලව;

(i) ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීම් සිදු කරන්නේ එය නොවැළැක්විය හැකි වුවහොත් පමණක් බවත්;

(ii) නැවත පිහිටුවීමේ ස්ථාන තෝරාගැනීම, ජීවන දීමනා සහ සංවර්ධන විකල්ප තීරණය කරනු ලබන්නේ බලපෑමට ලක්වූ පුද්ගලයින්ගෙන් සම්පූර්ණ තොරතුරු විමසීමකින් පසුව බවත්;

(iii) ආදේශක ඉඩම් සැපයීම හෝ වන්දි වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ නැතිවූ ඉඩම්, ඉදිකිරීම් සහ ජීවිකා වෘත්තීන් සලකා බැලීමෙන් පසුව බවත්;

(iv) මුළු ඉඩම සඳහා කඩිනමින් ප්‍රතිසම්පාදන අගයන් වශයෙන් වන්දි පිරිනැමෙන බවත්;

(v) ඉඩම් සඳහා ලේඛනගත හිමිකමක් නැති පුද්ගලයින්ටද සාධාරණ සැලකිල්ලක් දැක්වෙන බවත්; සහ

(vi) බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රතිස්ථාපනය කිරීමට උදව් දෙන බව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට පහසුකම් සැපයෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට කොළඹ නගර සභාව තුළ ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය පිළිපදින ලද අවස්ථා සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන කවරේද; සහ

(ii) සියලුම මහනගර සභා, නාගරික මධ්‍යස්ථාන සහ අගනගරවල ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය තදින්ම ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2037/'11

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝල තාප විදුලි බලාගාරය සඳහා ගල්අඟුරු සැපයීමේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති සමාගමේ නම කුමක්ද;

(ii) එම කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පත් කළ තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ගල්අඟුරු සපයනු ලබන ඉහත සමාගම වෙත ලබා දී තිබේද;

(ii) එම ඇගයීම් සහතිකය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගල්අඟුරු සැපයීමේ ගිවිසුම ආරම්භවන දිනය සහ බලපවත්නා කාල සීමාව කවරේද;

(ii) එම ගිවිසුම ආරම්භක අවස්ථාවේ සිට 2011 ඔක්තෝබර් මාසය දක්වා සපයා ඇති ගල්අඟුරු මෙට්‍රික් ටොන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී කාලසීමාව සඳහා සත්‍ය වශයෙන් අවශ්‍ය වූ ගල්අඟුරු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2219/’12

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) “මහින්ද චින්තන දිනවමු ශ්‍රී ලංකා” ප්‍රතිපත්ති මාලාවේ, ජනසෙවන වැඩසටහන යටතේ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල රජයේ සේවකයින් වෙනුවෙන් මහල් නිවාස යෝජනා ක්‍රම හතරක් ක්‍රියාත්මක කිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස යෝජනා ක්‍රම අතරින් මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස යෝජනා ක්‍රම පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට එම මහල් නිවාසවල පදිංචිකර ඇති රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් මහල් නිවාස යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2248/’12

6.

ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 වර්ෂයේදී වාර්තා වූ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව, හදාරා ඇති උපාධි පාඨමාලාව අනුව හා එක් එක් පළාත අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා 2011 වර්ෂය තුළ රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය විසඳීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඉදිරියේදී ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2631/'12

7\.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තවත් ශක්තිමත් කිරීමට හා එම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට ඇති බාධක ඉවත් කරන බවට රජය විසින් පොරොන්දුවක් ලබාදුන් බවත්;

(ii) නැවත 2007 විශ්ව වාරික විමසුම (UPR) රැස්වීම අවස්ථාවේදී ද දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට රජය පොරොන්දු වූ බවත්;

(iii) දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමෙන් එම පොරොන්දු කඩකර ඇති බවත්;

(iv) මෙම පොරොන්දු කඩකිරීම නිසා රජයේ විශ්වාසනීයභාවය ජාත්‍යන්තර වශයෙන් බිඳවැටී ඇති බවත්;

(v) එමගින් අප රට අපකීර්තියට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශයන් හා ශ්‍රී ලංකාව සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව තුළින් ස්වාධීන කොමිෂන්වල අවශ්‍යතාවය නිර්දේශකර ඇති හෙයින් දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කර ස්වාධීන කොමිෂන් ස්ථාපිත කිරීමට රජය වහාම පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2632/'12

8\.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගෙන තිබේද;

(ii) එම වර්ෂය තුළ බඳවාගනු ලැබූ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 මැයි මාසය වනවිට රට තුළ සේවයේ යෙදී සිටි පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා තවදුරටත් පුරප්පාඩු පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1879/'11

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හබුරුගල, හොරවල රෝහල මගින් ග්‍රාම නිලධාරී වසම් 18ක පමණ ජනතාවකට සේවය ලබාදෙන බවත්;

(ii) එම රෝහලට ප්‍රමාණවත් තරම් වෛද්‍යවරු නොමැති බවත්;

(iii) මේ හේතුවෙන්, එම රෝහල මේ වනවිට වැසීයාමේ අවදානමකට මුහුණ පා ඇති බවත්;

(iv) එම රෝහලෙහි මීට වර්ෂ 20කට පමණ පෙර ඉදිකිරීම් ආරම්භ කළ ගොඩනැගිල්ල මේ දක්වා අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හබුරුගල, හොරවල රෝහලෙහි පවතින වෛද්‍යවරුන්ගේ සහ ගොඩනැගිලිවල හිඟයට කඩිනමින් විසඳුම් ලබාදෙන්නේද;

(ii) ඒ සඳහා සැලසුම් සකස්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2137/'11

10\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගම වෙත ලබා දී ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන ලබාදුන් දිනයන් කවරේද;

(iii) ලබාදුන් එම වාහනවල අංක සහ වර්ගයන් කවරේද;

(iv) එම වාහන ලබා දීමට හේතු කවරේද;

(v) මේ වනවිට ආපසු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාගත් වාහන කවරේද;

(vi) ආපසු ලබාගත් වාහනවල තත්ත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහත සමාගම වෙත ලබාදුන් වාහන සඳහා නියමිත පරිදි ගෙවීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එක් එක් වාහනය සඳහා ලබාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2191/'11

11\.

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සමස්ත වගකීම් ප්‍රමාණය එක් එක් වරාය අනුව කවරේද;

(ii) වරාය අධිකාරිය විසින් ඇපවීම් සහ බැංකු ඇප ලබාදුන් හෝ ඔවුන් විසින් ලබා නොගත් ණය සඳහා වගකීම භාරගත් අවස්ථා කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ එළඹී ගිවිසුම ඉහත (අ)(i)හි දී ඇති වගකීම් සඳහා ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා වරාය අධිකාරියට අයත් හෝ වරාය අධිකාරිය වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි වරාය අධිකාරියට අයත් ඉඩම් එම ඉඩම්වල ප්‍රමාණයන්ද සමග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා වෙන් කර ඇති ඉඩම්වල සිදුකරමින් තිබෙන ක්‍රියාකාරකම් කවරේද;

(iv) වරාය අධිකාරිය විසින් නඩත්තු කිරීම සඳහා මුදල් වියදම් දරන ඉඩම් හෝ ගොඩනැගිලි සහිත ඉඩම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2011 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලැබූ ශුද්ධ ලාභය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2220/'12

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, නාගරික මහල් නිවාස හා රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන් තම නිවසේ සින්නක්කර අයිතිකරුවන් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ මාස තුනක් ඇතුළත නිම කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැඩපිළිවෙළ ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ තම නිවසේ සින්නක්කර අයිතිය ලැබූ නාගරික මහල් නිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචි ඉහත පරිදි සින්නක්කර නිවාස අයිතිය ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1880/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල අධ්‍යාපන කලාපයට අයත්, කටුවන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මීද්දෙණිය ප්‍රාථමික විද්‍යාලයේ පවතින ගොඩනැගිලි හා ගුරු හිඟය නිසා සිසුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති බවත්;

(ii) එම විදුහලේ ගොඩනැගිලි හිඟය සහ ගුරු හිඟය පිළිබඳව බලධාරීන්ට දන්වා සිටියත් මේ දක්වා විසඳුමක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම පාසල සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී දුම්රිය දෙපාර්තමේන්තුව ලැබූ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) අද වනවිට අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ස්ථිර සේවයට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව සහ අනියම් සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පත්වීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ මහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(v) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(vi) ඉහත ආයතනවලින් අනුමතිය නොලබා පත්වීම් සිදු කර තිබේද;

(vii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2192/'11

15.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යවරයා විසින් සිදුකරන ලද මුළු විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ සංචාරය කළ රටවල් කවරේද;

(iii) එම සංචාරයන් සම්බන්ධව දක්වා ඇති අරමුණු සපුරා ගැනීමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයා විසින් කැඳවාගෙන යන ලද නිලධාරීන් සංඛ්‍යාව සහ එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී සංචාරයන් සඳහා යොදා ගන්නා ලද අරමුදල් මහජන මුදල්ද, නැතිනම් සංචාරය කරන ලද රටවල රජයන් විසින් ප්‍රදානය කරන ලද මුදල්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**ශෝක ප්‍රකාශ යෝජනා**

1.

අභාවප්‍රාප්ත ගරු මහින්ද රත්නතිලක මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

දිවි නැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*9.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

10.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

11.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

12.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

කාසිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15.

ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

රංජිත් අලුවිහාරේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**